**නින්දවූර් ප්‍රාදේශිය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**----------------------**

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 21 දින ද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 24 දින සභාවේ, සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට නින්දවූර් ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
-------------------------------------------------------------

පළාත් පාලන පළාත් සභා අමාත්‍යාංශය ලේකම්ගේ 2014 ජනවාරි 27 දිනැති පීඑල්/05/පීජ්/එස්එෆ්පීඑස්ජ්එස් දරන චක්‍රලේඛය අනුව රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂන විය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ගෙවියයුතු රු. 8,250 ක විගණන ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) විදුලි ගාස්තු හා දුරකථන ගාස්තු සඳහා සමාලෝචිත වර්ෂය සඳහා ගෙවියයුතු එකතුව රු. 17,621 ක මුදල සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) 2013 දෙසම්බර් 31 දිනට රු. 140,730 ක් වටිනා විදුලි උපකරණ තොගය ගිණුම්වලට ගෙන නොතිබුණි.

1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2005 වර්ෂය දක්වා හිඟහිටි විදුලි පාරිභෝගිකයන්ගෙන් ලැබියයුතු විදුලි ගාස්තු එකතුව රු. 2,477,322 ක මුදල සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ලංකා විදුලි බල මණ්ඩලයට ගෙවියයුතුව තිබූ අවු. 20 කට වඩා පැරණි විදුලි ගාස්තු වන රු. 2,951,150 ක මුදල සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ස්ථාන මාරුවී ඇති නිලධාරි 10 දෙනෙකුගෙන් සහ සේවය හැර ගිය නිලධාරින් 06 දෙනෙකුගෙන් අයකරගතයුතු එකතුව රු. 114,003 ක්වූ ණය ශේෂය අදාල ආයතන වලින් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීම සඳහා 2014 ජුනි 13 දින දක්වා කටයුතු කර නොතිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ පහත දැක්වෙන අයිතමයන් ඉදිරියේ පෙන්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| අයිතමය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| ලී බඩු උපකරණ හා සවිකිරීම | 1,390,200 | ස්ථාවර වත්කම් ලේඛනය, සමීක්ෂන මණ්ඩල වාර්තා |
| මෝටර් වාහන | 4,357,640 | |
| යන්ත්‍රෝපකරණ | 11,620,115 | |
| සේවක ණය | 2,875,096 | කාල විශ්ලේශණය |
| පුස්තකාල පොත් | 2,302,980 | පුස්තකාල පොත් ලේඛනය, සමීක්ෂන මණ්ඩල වාර්තා |

1.3.5 නීති, රීති සහ රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 12(1) සහ (2) වගන්ති සහ පළාත් පාලන, නිවාස ඉදි කිරීම් සහ ඉදි කිරීම් කර්මාන්ත අමාත්‍යාංශයේ 1988 ජනවරි 13 වන දින අංක 488/16 දරණ ගැසට් පත්‍ර දැන්වීමේ 31(1) වන උප වගන්ති | පහත සඳහන් එක් එක් කාර්ය සඳහා ප්‍රාදේශිය සභාවට උපදෙස් ලබා දීම සඳහා වෙන්වෙන් වශයෙන් කමිටු පත්කල යුතු බව දක්වා තිබුනද, ඒ අනුව කමිටු පත්කර නොතිබුණි.<br>• මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම්<br>• නිවාස ඉදි කිරීම සහ සමාජ සංවර්ධන<br>• තාක්ෂණ සේවා සහ<br>• පරිසර හා පොදු පහසුකම් |

| | | |
|---|---|---|
| (ආ) | 1988 ප්‍රාදේශය සභා (මූල්‍ය හා පරිපාලන) රීති පරිච්ඡේදය X වගන්තිය 217 | සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා සියළුම ඉඩම් සහ ගොඩනැගිලි සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම් රු. 1,608,656 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම් රු. 2,437,836 ක් වූ හෙයින් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 829,180 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

2.2 ආදායම් පරිපාලනය
----------------------

1980 වර්ෂය සිට 2012 වර්ෂය දක්වා හිඟව තිබූ මස් කඩ බදු කුලිය වන රු. 3,177,096 මුදල අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය
----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2004 වර්ෂයේදී අයකර 2012 වර්ෂය අවසානය දක්වා තැන්පත් ගිණුමේ පෙන්වා තිබූ එකතුවූ අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු එකතුව රු. 394,488 ක මුදල දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් වරයා වෙත ප්‍රේක්ෂණය නොකර සමාලෝචිත වර්ෂයේදි සභාවේ ආදායම් ගිණුමට මාරු කර තිබුණි.

(ආ) මහජන පුස්තකාලයේ පිටතට පොත් ගෙනයන අංශයේ සාමාජිකයන් 30 දෙනෙකුගෙන් රු. 7,018 ක වටිනා පොත් 30 ක් නැවත භාර දිය යුතු කාලය ඉක්මවී ඇතත් ඒවා ලබා ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඇ) මහජන පුස්තකාලයේ 2010 වර්ෂයේ සිට 2014 ජූනි 13 දක්වා තොරතුරු ලබා ගන්නා අංශය නිෂ්ක්‍රියව වසා තිබුණි.

(ඈ) විවිධ කාර්යයන් සඳහා තැන්පත් ගිණුමේ තැන්පත් කරන ලද එකතු අගය වන රු. 492,005 මුදල ආදායම් ගිණුමට මාරු නොකර තැන්පත් ගිණුමේ වර්ෂ 03 පමණ කාලයක් පෙන්වා තිබුණි.

3.2 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

------------------------------------------

3.2.1 කඩදාසි ප්‍රතිචක්‍රීය කිරීමේ යන්ත්‍රය ප්‍රයෝජයනට නොගැනීම

-----------------------------------------------------------------

2008 වර්ෂයේදී රු. 731,600 ක මුදලට සභාව විසින් මිලදීගෙන තිබූ කඩදාසි ප්‍රතිචක්‍රීය කිරීමේ යන්ත්‍රය අදාල කාර්‍ය්‍ය සඳහා යොදවා ගැනීමෙන් තොරව 2014 ජුනි 13 දින දක්වා ගබඩාවේ රඳවා තිබුබව නිරික්ෂණය විය.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් නිශ්චිත විශේෂ පළාත් සංවර්ධන ආධාර යෝජනා ක්‍රමය යටතේ මිළ දී ගෙන තිබූ රු.299,965 ක් වටිනා කසල එකතු කරන මලු 35,290 කින් 98% පමණ අදාල කාර්ය සඳහා යොදවා ගැනීමෙන් තොරව ගබඩාවෙ තිබූ බව නිරික්ෂණය විය.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

------------------------

එක් එක් පළාත් පාලන ආයතන තම තමන්ගේ හැකියාව අනුව අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා ගතයුතු බව පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2005 නොවැම්බර් 08 දිනැති අංක 03 දරන පළාත්පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛයේ 8 වන වගන්තිය පරිදි සභාවේ අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණි.

5. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ස්ථාවර වත්කම් පාලනය